සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணை மதிப்பீடு - **2018**
**First Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I&II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

**I පත්‍රය අංක 1 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට ඉතාම නිවැරදිව ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ''උන් වපුරන්නේවත් කපන්නේවත් නැත'' යැයි දෙවිපියාණන් වහන්සේ පැවසුවේ කා ගැන ද?.
1. මිනිසා ගැන 2. සිවුපාවුන් ගැනය 3. කුරුල්ලන් ගැනය 4. ආදම් ගැනය

(2) ජල බිංදුවක ක්‍රියාකාරීත්වය තුළ දෙවිඳුන් අපට පෙන්වා දෙන වටිනාම සත්‍යතාවය වන්නේ,
1. මැවිල්ල තුළ ජලය අවස්ථා තුනක පවතින බවය.
2. දේව මැවිල්ල තුළ අඛණ්ඩ ක්‍රියාකාරීත්වයක් පවතින බවය.
3. වලාකුළුවලින් අපට අවශ්‍ය ජලය පමණක් ලැබෙන බවය.
4. මැවිල්ල තුළ ජලය ඉතාම පිරිසිදු තත්ත්වයේ පවතින බවය.

(3) වැයවෙමින්, දිරියෙන් යුතුව දේව සේවය කිරීම විදහා දැක්වීමට ජේසුස් වහන්සේ භාවිතා කළ සංකේතයන් වන්නේ,
1. අන්ධකාරය හා ආලෝකය 2. පහන් හා ආලෝකය
3. මිදි වතු හා දල් වූ පහන් 4. ලුණු හා ආලෝකය

(4) ''ඔබම ගැලවී කුරුසියෙන් බැස එන්නැයි'' පවසමින් ජේසුස්වහන්සේට අපහාස කළේ කවුරුන්ද?.
1. නායක පූජකවරුන් ය. 2. විනයධරයන් ය. 3. මහමග ගිය අයය. 4. හේවායින් ය.

(5) ස්නාවක ජොහාන්තුමාගේ සේවයට සම්බන්ධ <u>නොවන</u> ප්‍රකාශය තෝරන්න.
1. නිහතමානී, ආදර්ශවත් බව පෙන්වීම.
2. ශුද්ධාත්මයෙන්ද, ගින්නේද බව්තිස්මය ලබා දීම.
3. අවංකව ම මනස්ථානයෙන් බෞතිස්මයට කැඳවීම.
4. සේවයට සූදානම හා සරල ජීවිතයේ ආදර්ශය පෙන්වීම.

(6) දේව ප්‍රේමය තුළ අපට වැරදි කරන අයට අප කුමක් කල යුතු ද?
1. දඬුවම් දීම 2. බලය දීම 3. සමාව දීම 4. සුවය දීම

(7) ජුදෙව් සමාජයේ දේව මාලිගාවට හෝ ධර්මශාලාවලට යෑමට අවසර නොලත් කණ්ඩායම් වන්නේ,

1. කාන්තාවන්, අයකැමියන්, දරුවන්
2. දිළිඳුන්, තරුණයින්, පරිසිවරුන්
3. දරුවන්, ප්‍රජාමූලිකයින්, පාලකයින්
4. මහල්ලන්, රෝගීන්, සද්දුසිවරු

(8) වත්මන් සමාජයේ මිනිසාගේ ආත්මාර්ථකාමී ක්‍රියාකාරකමක් වන්නේ,

1. සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය.
2. බහුලව ශාක වගා කිරීම.
3. ශ්‍රමදානයන්ට දායකත්වය ලබා දීම.
4. වනාන්තර එළිපෙහෙළි කිරීම.

(9) '' දිය බිඳු පොළවෙන් ඉහළට ඇඳගෙන වාෂ්ප මගින් වැසි වස්සන්නේ දෙවිඳාණෝය.'' මෙය උපුටාගත් පැරණි ගිවිසුමේ ග්‍රන්ථය වන්නේ,

1. ජෝබ්
2. ගීතාවලිය
3. උත්පත්ති
4. ගණන් කථාව

(10) නෝවාගේ කාලයේ ඇති වූ සමාජ දූෂණය වීමේ ප්‍රතිඵලය වන්නේ,

1. ගිනි කඳු ඇති වීම
2. වායු දූෂණයක් ඇති වීම
3. නියඟයක් ඇති වීම
4. ජල ගැල්මක් ඇති වීම

(11) පවුලේ නිර්මාතෘවරයාණන් වන්නේ,

1. පියා ය
2. දෙවියන් වහන්සේ ය.
3. මව ය
4.දරුවන්ය

(12) දෙවියන් වහන්සේගේ තිරසර ප්‍රේමයෙන් ශක්තිමත් වන අප අන් අයගේ ජීවිතය,

1. වරදට පෙළඹවිය යුතුය
2. ලෝකයට යොමු කළ යුතුය
3. පහතට හෙලිය යුතුය
4. නගා සිටු විය යුතුය

(13) ස්නාවක ජොහාන්තුමාගේ වස්ත්‍රය නිම වී ඇත්තේ,

1. ඔටු ලෝම වලිනි
2. බැටළු හම් වලිනි
3. ලිනන් රෙදි වලිනි
4. ගෝනි රෙදි වලිනි

(14) කිතුණු දරුවෙකු වන ඔබ සීමිත සම්පත් රැක ගැනීමට යොමුවන අවස්ථාවක් වන්නේ,

1. වගුරු බිම් ගොඩ කිරීම
2. වන සතුන් පාලනය කිරීම
3. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම
4. ගොඩනැගිලි ඉදි කිරීම

(15) ස්නාවක ජොහාන් විශේෂ දූත මෙහෙවරකට කැප කළ කෙනෙක් බව ස්නාවක ජොහාන්ගේ පියාට දැන් වූයේ,

1. ජේසුස් වහන්සේ විසිනි
2. මරිය තුමිය විසිනි
3. ගාබ්‍රියෙල් දේවදූතයා විසිනි
4. ඇතිනා දූතයා විසිනි

(16) '' ඔබ ගන්නා සෑම පියවරකදීම ඔබ රක්නා පිණිස එතුමාණෝ සියදූතයන්ට අණ දෙන සේක.'' මෙසේ සඳහන් වන පැරණි ගිවිසුමේ පොත,

1. ගීතාවලිය
2. හිතෝපදේශ
3. ගණන් කථාව
4. ධර්ම දේශකයා

(17) දේව ගරු බිය පෑම යනු,

1. ව්‍යවස්ථාවේ උල්පතයි
2. ප්‍රඥාවේ උල්පතයි
3. ආගමික වතාවන්ගේ උල්පතයි
4. සහභාගීකමේ උල්පතයි

(18) දේව මැවිල්ලේ ප්‍රධාන තැන දුන්නේ,
1. සතුන්ට ය. 2. කුරුල්ලන්ට ය. 3. මසුන්ට ය. 4. මිනිසා ට ය.

(19) අපගේ අසල් වැසියන්ගේ ජීවිත සම්බන්ධ කිතුණු අප ක්‍රියා කළ යුත්තේ,
1. ගෞරවයෙන් සැලකීමෙන් ය. 2. අවමානයෙන් සැළකීමෙන් ය.
3. සුළු කොට සැලකීමෙන් ය. 4. පහත් කොට සැලකීමෙන ය.

(20) ජේසුස් වහන්සේ ''දිවැසිවරයෙකුටත් වඩා ශ්‍රේෂ්ඨ යයි ප්‍රකාශ කළේ කා ගැනද?
1. ස්නාවක ජොහාන් තුමා 2. දුවිත් තුමා 3 ජෝබ් තුමා 4. මරිය තුමි

(ල. 2x20=40)

## II කොටස

I වන ප්‍රශ්නය හා තවත් තෝරාගත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න. I වන ප්‍රශ්නය අනිවාර්යය.

1. I වාරය සඳහා ඇගයීමක් ලෙස ඔබ කරන ලද පිටු පෙරලනය හෝ වැකකි නිර්මාණය, කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු සපයන්න.

i. කණ්ඩායම් ක්‍රියාකාරකම ලෙස ඔබ කණ්ඩායම ලද මාතෘකාව කුමක්ද?
ii. ඔබ කණ්ඩායම එයට සූදානම් වීමට කුමක් කළේද?
iii. දේව මැවිල්ල සුරැකිම පිළිබඳව සඳහන් වන බයිබල් පාඨයක් දක්වන්න.
iv. එය අලංකාර වත් සැකසීමට ඔබ යොදා ගත් අමුද්‍රව්‍ය මොමවාද?
v. මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමේදි ඔබ මුහුණ දුන් ගැටලුවක් හා එය විසදාගත් ආකාරය දක්වන්න.
vi. මෙම ක්‍රියාකාරකම කිරීමෙන් ඔබ ජීවිතයට උගත හැකි පාඩමක් දක්වන්න.
vii. මෙම ක්‍රියාකාරකමෙන් පසු පාසල් වත්තේ අලංකාරයට ඔබ සිදු කල දේවල් දෙකක් දක්වන්න.
viii. මෙම ක්‍රියාකාරකම කිරීම ඔබ කරුණු රැස් කරගත් මූලාශ්‍ර 2ක් නම් කරන්න.
ix. කිතුණු දරුවකු සේ ඔබ නිවස අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට ඔබ කරන ක්‍රියාකාරකම් 2ක් දක්වන්න.
x. මැවිල්ලේ කුමන කාර්යයන් ඉටු කිරීමට දෙවිදුන් අපව පත් කළේද?

(ල. 2x20=40)

2. i. ''කුමක් කමුද කියා ජීවිතය ගැනවත් කුමක් අඳිමුද කියා ශරීරයගැනවත් කරදර නොවන්න'' යැයි කීවේ මන්ද? (ල.2)
ii. ළමා අයිතීන් සුරැකීමමට දායකවන රාජ්‍ය ආයතන 3ක් නම් කරන්න. (ල.3)
iii. කිතුණු දරුවෙකු සේ පාසලේදී ඔබේ මිතුරෙකුගෙ/මිතුරියකගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කළ අවස්ථාවක් විස්තර කරන්න. (ල.5)

3. i. ''පොළොං වංශය'' යැයි ස්නාවක ජොහාන්තුමා ආමන්ත්‍රණය කළේ කවුරුන්ටද? (ල.2)
ii. ස්නාවක ජොහාන්තුමා මනස්ථාපනයේ දුක මෙහෙයට ඉගැන්වූ පාඩම් 3ක් දක්වන්න. (ල.3)
iii. අපගේ පව් ගැන පසුතැවිලි වෙමින් කරන යැදුමක් ලියන්න. (ල.5)

4. i. ''රත්තරන් ඉතා වටිනා ලෝහයකි.'' මේ අනුව කිතුණු ප්‍රේමය සවිමත් කිරීමට අදාළවන ආඥාව දක්වන්න. (ල.2)

ii. දේව දරුවෙකු සේ අන් අය ඔබට කෙසේ සලකනවාට ඔබ කැමතිද? (ල.3)

iii. ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනය සිදුකරන අවස්ථාවේ ඔබත් එම ජනකාය අතර සිටියේ යැයි සිතා එදින ලද පණිවිඩය ගැන වාක්‍ය 10 ක් ලියන්න. (ල.5)

5. i. දෙවිපියාණන් දුන් 'මනහර ලොව තුළ ජලය' ගැන වාක්‍ය 2ක් ලියන්න. (ල.2)

ii. ලොව චක්‍රාකාර දේව නිමවුම්වලට උදාහරණ තුනක් දක්වන්න. (ල.3)

iii. පරිසරය රැක ගැනීමට ඔබට දායක විය හැකි අවස්ථා 5ක් දක්වන්න. (ල.5)

6. i. දේව කැමැත්තට එරෙහි වීමට බලපෑමක් ඇති බව පෙන්වීමට ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවක් දක්වන්න. (ල.2)

ii. උන්වහන්සේ පරීක්ෂා ජය ගැනීමට භාවිත කළ උපක්‍රම දෙකක් දක්වන්න. (ල.3)

iii. වැරදි පුරුද්දකට යොමු වී සිටින ඔබේ මිතුරෙක්/මිතුරියක් යහපත් මාර්ගයට ගැනීමට ඔබ සහය වන ආකාරය විස්තර කරන්න. 5

7. පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. දේව මැවිල්ල ක්‍රමවත්ය  ii. ස්නාවක ජොහාන් තුමා ගේ සේවය

iii. ජේසුස් වහන්සේ ට පැමිණි පරීක්ෂා  iv. දේව දරුවකු ලෙස ක්‍රියා කරමු